# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

# පරිසර අමාත්‍යාංශය

# ඇබෑර්තු

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් ස්ථාපනය කරන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවතින පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. කැණීම් ඉංජිනේරු තනතුර (05)**

**02. පර්යේෂණ සහකාර තනතුර (02)**

**අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද**

**01. කැණීම් ඉංජිනේරු තනතුර**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**අධ්‍යාපනික :**

විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කැණීම් හා ඛනිජ පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය (Bsc Mining and Minerals Engineering Degree)

විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක භූ සම්පත් පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය (Bsc Earth resources Engineering Degree)

සහ

**සේවා පළපුරුද්ද :**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ කැණීම් ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් (1) වසරක සේවා සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත (1 හෝ 2) සුදුසුකම් ලබා තිබීම

**සේවා පළපුරුද්ද :**

කැණීම් ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි වේ.

MM 1-1 2016 - 53,175-10x1,375-15x1,910-95,575.00 + අනුමත දීමනා

**වයස් සීමාව :**

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**02. පර්යේෂණ සහකාර තනතුර**

**බාහිර අයදුම්කරුවන් :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කළ පර්යේෂණ කාර්යන් පිළිබඳ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 5 (NVQ Level 5) නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ඉහත සඳහන් පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි වේ.

MA2-2 2016-30,310-10x300-7x350-4x600-20x710-52,360.00 + අනුමත දීමනා

**වයස් සීමාව :**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**තනතුරට අදාළ පොදු කොන්දේසි :**

- තෝරාගනු ලබන අයදුම්කරුවන් තම වැටුපින් 10% කින් සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතුය. කාර්යාංශය සේවක අර්ථසාධක අරමුදලට (EPF) 15% කින් දායක වන අතර, ඊට අමතරව සේවක භාරකාර අරමුදලට (ETF) 3% කින් දායක වනු ඇත.
- රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා හිමිකම් ඇත.
- බාහිර රෝගී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ පහසුකම් සඳහා හිමිකම් ඇත.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම් කළ යුතුය.
- අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.
- අධ්‍යාපනික හා අනෙකුත් සහතික වල ඡායා පිටපත් අයදුම්පතට ඇමිණිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ අයදුම්පත් 2023.07.02 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන),**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**නො. 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**